
# ඒබ්‍රහම්

ABRAHAM LINCOLN 1809-1865 Ceylon - Sm. island So. of India
1959-167
Sinhalese - 10,000 for USIS-Colombo, Ceylon
Singhalese



SINGHALESE

1959-167

U.S.Information Service

Abraham Lincoln 1809-1865

LINCOLN NATIONAL LIFE FOUNDATION

# ඒබ්‍රහම් ලින්කන්

## (1809 - 1865)

අමෙරිකා එක්සත් ජනපද රාජ්‍යයේ

16 වන

ජනාධිපතිවරයා

**ඒබ්‍රහම් ලින්කන්** - තමන් තුළ පිහිටියාවූ දයාව, කාරුණ්‍යාව හා ඉවසීම යන උසස් ගුණාංග යන් නිසාත්, මහජනයා සඳහා මහජනයා විසින් සකස් කරන ලද මහජන ආණ්ඩු ක්‍රමයකට ඇති ආදරය හා භක්තිය නිසාත් මිනිසුන් අතර ජීවත්වී මරණයට කැපවූ ආකාරය නිසාත් අමෙරිකාවේ 16 වන ජනාධිපති වරයා වූ ඒබ්‍රහම් ලින්කන් තුමාට ලෝක ඉතිහාසයෙහි හිමිවී ඇත්තේ ශ්‍රෙෂ්ඨ ස්ථානයකි.



ඉරණම— වර්ෂ 1809 ලින්කන් මෙලොව එළිය දුටු කාලයේදී අමෙරිකාවෙහි වහල් මෙහෙය තදින්ම පැවතුණේය. ඉරණම අනුව ලින්කන්ට හිමිවීමට තිබුණේ නූගත් ගොවි කම්කරුවෙකුගේ ජීවිතයකි. වහල් මෙහෙය තහනම් කොට හැම රට වැසියෙකුටම නිදහස සහ සමාන අයිතිවාසිකම් ලබා දීමෙන් මිනිස් සංහතියේ උසස්ම තැනක් ලැබීමට එතුමාට ඉරණමෙන් ඉඩ නො තිබුනි. පුද්ගලයාගේ අයිතිවාසිකම් හා වටිනාකමත් ප්‍රජාතන්ත්‍ර වාදයෙහි නියම අදහසත් ලින්කන් තුමාගේ ජීවිතයෙහි ගැබ්වී තිබේ.



**ප්‍රශ්නයක්** - ඒබ්‍රහම් එකොළොස් හැවිරිදි වයස් ගතවන විට ලින්කන් ගොවිපල අසල පාසැලක් විවෘත කරන ලද්දේය. ඒ සමගම ඒබ්‍රහම් ලින්කන් මේ පාසැලට යැවිය යුතුද නැද්ද යන ප්‍රශ්නයක්ද මතුවිය. ශක්තිමත් දේහයක් ඇති ඒබ්‍රහම් වැනි ලමයෙකු පාසැල් යවනවාට වඩා ගොවිපලේ වැඩට යොදවා ගැනීම ප්‍රයෝජනවත් බව පියාගේ මතය විය. එහෙත් ලමයා පාසැලට යැවිය යුතු බව ලින්කන්ගේ කුඩම්මා කියා සිටියාය.



පොත්පත් - ඒබ්‍රහම්ගේ කුඩම්මාගේ බලවත් උවමනාව පිට ඔහු පාසැලට යවන ලද්දේය. ඒබ්‍රහම් පොත්පත් වලට ඇල්මක් දක්වන්නට පටන් ගත්තේ මෙතැන් සිටය. එහෙත් ඔහුට නොකඩවා පාසැල් යාමට ඉඩ ලැබුණේ නැත. ගොවිපලේ වැඩ වලට නොයෙක් විට ඒබ්‍රහම්ට නැවතීමට සිදුවිය. කෙසේ වෙතත් අවුරුද්දක්වත් ඒබ්‍රහම් පාසැල් ගියේ නැත. අතට අසුවූ හැම දෙයක්ම ඔහු කියවූයේය. සමහර විට පොතක් ණයට ඉල්ලා ගැනීමට හෝ ආපසු ගෙන ගොස් දීමට ඔහු සැතපුම් ගණන් පයින් ගමන් කළේය.



**ඉගෙනීම** - දිනපතා ගොවිපලේ වැඩ කරන ඒබ්‍රහම් සවස ගෙදර පැමිණී පසු පොත් පාඩම් කලේ ගේ ඇතුලත උෂ්ණ කිරීම සඳහා සකස් කල ගිනි මැලයේ ආලෝකයෙනි. ඒබ්‍රහම් වාක්‍ය ආදිය ලීවේ ලෑල්ලකය. හුණු කැටයක් වෙනුවට ඔහු අඟුරු කෑල්ලක් පාවිච්චි කලේය. වරක් ලෑල්ල පිරෙන තෙක් ලියන ඒබ්‍රහම් ඉතිරි කොටස ලියන්නට ඉඩ ගන්නේ මුලින් ලිව් කොටස මකා දැමීමෙනි.



ලිපිකරුවා - වයස අවුරුදු 22 දී ඒබ්‍රහම් ලින්කන් ඉලිනොයිස් ජනපදයේ කෙළවර පිහිටි වෙළඳ බඩු ගබඩාවක ලිපිකරුවෙකු වශයෙන් සේවය කළේය. තරුණ ලින්කන් තුළ දකින්නට තිබුන අවංක භාවය කරුණාව, යමක් හරි හැටි හිතා මතා අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ ඔහුගේ අහිංසක රස කතාවල ඇති අගයත් නිසා බොහෝ දෙන ඔහු වෙතට ඇදී ආහ. කථාන්තර කීමට දක්ෂයෙකු වූ ලින්කන් වාද විවාද කිරීමටද ගජ හපනෙකි. ආණ්ඩු ක්‍රම ගැන හොඳ දැනීමක්ද ඔහුට තිබුනේය. ඉලිනොයිස් ජනපද මන්ත්‍රණ සභාවෙහි ආසනයක් සඳහා ඉදිරිපත් වන ලෙස මිත්‍රයෝ ලින්කන්ට කීහ.



මන්ත්‍රීවරයෙක් - ලින්කන් දේශපාලන කටයුතු කිරීමට පටන් ගත්තේ වයස අවුරුදු 25 දිය. ලින්කන් නිවට පෙනුමක් ඇති උස තරුණයෙක් විය. පලල් වාටියක් සහිත තොප්පියක් හිස පැළඳි ඔහු ගෙදරදී මසාගත් කමිසයක් හැඳ ඊට උඩින් වලිගා වැනි දිග කොන් දෙකක් සහිත දිග කබායක් ඇන්දේය. ලින්කන් ගේ කලිසම් කකුල් සපත්තු දක්වා පහතට තිබුණේ නැත. ඒ නිසා අමුත්තන්ට ලින්කන් පෙනුණේ බහුබූතයෙකු ලෙසිනි. නමුත් මහ-ජනයා අමතා කථා කරන විට ඔහුගේ අවලක්ෂණ කම් සියල්ලම නැති වන්නේය. 1834 දී ලින්කන් ඉලිනොයිස් මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයෙකු වශයෙන් තෝරා ගන්නා ලද්දේය.




**විවාහය** - තරුණ ලින්කන් ඈන් රට්ලෙජ් නම් තරුණියකට ආලය කළේය. එහෙත් විවාහ වන්නට ඔන්න මෙන්න කියා තිබියදී ඈන් මළාය. මෙයින් ලින්කන්ගේ හදවත බිඳී ගියේය. ශෝකය තුනීකර ගැනීම සඳහා ලින්කන් මහජනයාට වැඩි වැඩියෙන් වැඩ කිරීමටත් සේවය කිරීමටත් පටන් ගත්තේය. ඊට අවුරුදු කීපයකට පසු නීතිවේදියෙකු වශයෙන් කටයුතු කරගෙන යන කාලයේදීය මේරි ටොඩ් නම් තරුණිය හමුවූයේ. 1843 දී ඔව්හු විවාහ වූහ. අමෙරිකානු කොන්ග්‍රස් සභාවේ ආසනයකට තරග කරන ලෙස ලින්කන්ගේ මිත්‍රයෝ ඔහුට කීහ.



**කොන්ග්‍රස් සභාව** - වයස අවුරුදු 37 දී ඒබ්‍රහම් ලින්කන් ජාතික දේශපාලන කටයුතු වලට බැස්සේය. ඒ අනුව අමෙරිකානු කොන්ග්‍රස් සභාවෙහි මහජන මන්ත්‍රී මණ්ඩලයෙහි ආසන-යක් සඳහා ලින්කන් තෝරා ගන්නා ලද්දේය. මෙහිදී හෙතෙම වහල් මෙහෙයට විරුඬව දැඩි වූත් ස්ථිර වූත් ක්‍රියා කලාපයක් ගෙන ගියේය. වහල් මෙහෙය අලුතෙන් තව තවත් ජනපදවලට පැතිරී යෑම වැලැක්වීමට ලින්කන් උත්සාහ කළේය.






**බෙදී සිටීම** - අමෙරිකාව යටත් විජිතයක් වශයෙන් තිබුණ කාලයේ සිටම එහි ගෙන එන ලද නීග්‍රෝ ජාතිකයින් වහලුන් හැටියට වැඩෙහි යොදවන ලද්දේය. මේ කාලය වන විට වහල් ප්‍රශ්නය උඩ රටේ ජනතාව කොටස් දෙකකට බෙදී සිටියහ. නිදහස් රටක එක් මිනිහෙක් තවත් මිනිහෙකු වහලෙකු වශයෙන් තබාගෙන සිටීමේ ක්‍රමයට විරුඩව ලින්කන් තම සටන ආරම්භ කළේය. ලින්කන් විශ්වාස කළේත් නිතරම කීවේත් නිදහස් ලෙස ජීවත්වීම සෑම මිනිසෙකු-ටම සදාකාලිකව ඇති ශුඩ අයිතිවාසිකමක් බවය.



ජනාධිපති - ලින්කන් වහල් මෙහෙයට විරුඩ සටන අභීතව ඉදිරියටම ගෙන ගියේය. 1860 දී නොයෙක් නොයෙක් විරෝධතා මධ්‍යයේ ඒබ්‍රහම් ලින්කන් තුමා අමෙරිකා එක්සත් ජනපද රාජ්‍යයේ ජනාධිපතිවරයා හැටියට තෝරා පත්කර ගන්නා ලද්දේය. මේ කාලයේදී රටේ නොසන්සුන් තාවයක්ද ඇති විය. ලින්කන් ජනාධිපති වීමෙන් පසු බලාපොරොත්තු වූ පරිදි වහල් ප්‍රශ්නය උඩ ජනතාව කොටස් දෙකකට පත්විය. දකුණු දිග ජනපද එකොළොසක් වෙන්වී අභිනව සංවිධානයක් පිහිටුවා ගත්හ.



යුද්ධය - සාමය හා එක්සත්කම ආරක්ෂා කර ගැනීමට ලින්කන් ජනාධිපතිතුමා කල උත්සාහ යන්ද නොතකා සුළු දෙයක් විශාල අරගලයක් බවට පත්කර ගත් ඉහත කී අලුත් සංවිධානය මූලින් තිබුන එක්සත් ජනපදයට අයත් බලකොටුවකට පහර දීමෙන් අමෙරිකාවේ අභ්‍යන්තර යුඩයක් (1861-65) ඇති කරන ලද්දේය. මේ නිසා කාරුණික ලින්කන්ගේ හදවත ශෝකයෙන් ඇලලී ගියේය. මෙයින් සිදුවූයේ වහල් මෙහෙය තවත් පැතිරී යාම පමණක් නොව අමෙරිකානුන්ද ඔවුනොවුන් ඇන කොටා ගන්නට පටන් ගැනීමය. ආණ්ඩුවේ හමුදාවන් විශාල ලෙස පරාජය වන්නට පටන් ගැනුණි.



මුද්‍ර ගැනීම - මෙම යුද කලබල මධ්‍යයේ 1863 දී ලෝක ඉතිහාසයේ ඉතාමත් වැදගත් ප්‍රකාශනය ඉදිරිපත් කරන ලද්දේය. අමෙරිකාවේ සියලුම වහලුනට නිදහස දෙමින් ඔවුන් මුදා හැරීමේ ඒ ඓතිහාසික ප්‍රකාශනය ලින්කන් ජනාධිපතිතුමා විසින් ප්‍රසිඩ කරන ලද්දේය. වරක් සාමකාමී ගොවි බිම් වශයෙන් තිබුන ජනපද යුද බිම් බවට පත්වී අසරණ රටවැසියන් මියයන හැටි දුටු ලින්කන් ජනපද අතරේ එක්සත්කම නැවතත් ඇතිකොට සාමය පැතිර වීමට ඉටා ගත්තේය.



සාමය - 1865 දී එක්සත් ජනපද හමුදවන්ට ජය අත්වීමෙන් යුධය අවසන් විය. පවුල් අතරේ තිබුන අරගල ඊට පසු ඇති නොවීය. රටේ අභ්‍යන්තර කැරලි කෝලාහල සතර අවුරුද්දක් මුලුල්ලේ පැවතුනි. නිදහස සහ සාමය නැවත වරක් රජ කරන්නට පටන් ගැණුනි. ජනපද අතර සමගියද ආරක්ෂා විය. මේ ගැන ප්‍රීතියට පත් රට වැසියෝ ප්‍රීති ඝෝෂා පවත්වන්නට පටන් ගත්හ. මේ ගැන දෙවියන්ට ස්තුති ප්‍රශංසා කරමින් රටේ හැම දේවස්ථානයකම දේව මෙහෙයන් පවත්වන ලද්දුහ.



**මරා දැමීම** - රටේ සාමය හා එක්සත්කම තහවුරු වීමට තමා විසින් සකස් කළ වැඩ පිළිවෙළෙහි ප්‍රතිඵල දැකීමට ලින්කන් ජනාධිපති තුමා ජීවත්ව නොසිටියේය. යුධ කලබල අවසන් වී හරියටම දවස් පහකට පසු ලින්කන් වොෂින්ටන් නුවර නාට්‍ය ශාලාවක වාඩිවී සිටිද්දී ජෝන් විල්ක්ස් බූත් නමැති උමතු නලුවෙකු විසින් හිසට වෙඩි තබා මරා දමනු ලැබීය. වෙඩි තබා පැය කීපයකට පසු ලින්කන් මිය ගියේය. එහෙත් ලින්කන් විසින් ආරම්භ කළ උදාර කටයුත්ත නිමාවකට පත්වී තිබුණේය.



කොළඹ එක්සත් ජනපද ප්‍රවෘත්ති සේවය මගින්
බෙදා හරින ලදී.

9-8852